# ජනතාවට ගරුකරන දේශපාලන සංස්කෘතියක් බිහිකිරීමට ශ්‍රී ලංකා ජාතික සංගමයෙන් යෝජනා රැසක්

මහ මැතිවරණයෙන් පසුව සුබවාදී පාලනයක් උදෙසා රජය පොළඹවන කරුණු දොළහකින් යුත් න්‍යාය පත්‍රයක් ශ්‍රී ලංකා ජාතික සංගමය සම්පාදනය කර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නටත්, සිවිල් සමාජය ශක්තිමත් කරන්නටත් හේතුවන මෙම කරුණු වෙනුවෙන් මහජනතාව සමඟ සම්මුතියකට එළැඹෙන බව එහි නායක අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා කියා සිටියි.

දශක තුනකට අධික කාලයක් දේශයේ ආර්ථික සමාජයීය දියුණුව අඩාල කළ ගැටුම් නිරාකරණය වී සාමය කරා ගමන් කරන යුගයේදී තමන් ඇතුළු කණ්ඩායම මෙම කරුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා කැපවීමෙන් ක්‍රියා කරන බව මෙම න්‍යාය පත්‍රය ඉදිරිපත් කරමින් මොරගොඩ මහතා ප්‍රකාශ කරයි.

ජනතාවට ගරු කරන දේශපාලන සංස්කෘතියක් බිහිකිරීම පුර නැඟුම හා සහන සෙවන, තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කර දූෂණ අවම කිරීම, නීතිය හා යුක්තිගරුක සමාජයක් බිහිකිරීම අධ්‍යාපනයේ විප්ලවීය වෙනසක් ඇතිකිරීම ආර්ථික සංවර්ධනය තුළින් සමෘද්ධිය ඇති කිරීම කාන්තා නියෝජනය සමබර කිරීම, අයිතිවාසිකම් තහවුරු කිරීම, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලබාදීම, අප සැමගේ ශ්‍රී ලංකාව-ජාතීන් අතර විවිධත්වය ශක්තියක්සේ සැලකීම, බලය බෙදා හැරීම මගින් ජනතාව සවිබල ගැන්වීම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සමාජයට ශක්තියක් කර ගැනීම සහ මහ සඟරුවන කේන්ද්‍ර කරගත් බුද්ධ දර්ශනය ජාත්‍යන්තරයට පතුරවන වැඩ පිළිවෙළක් ද මෙම න්‍යාය පත්‍රයට ඇතුළත්ය.

එක් එක් විෂයයන් සම්බන්ධව ප්‍රායෝගික ක්‍රියාකාරීත්ව සැලැස්මක් ද හඳුන්වාදී ඇති අතර මහජනතාව හා උනන්දුවක් දක්වන ක්‍රියාකාරී ආයතන සම්බන්ධ කර ගනිමින් සැලසුම් ඉදිරියට ගෙනයාම සඳහා දොළොස් දෙනෙකුගෙන් යුත් විද්වත් මණ්ඩලයක්ද පත්කර තිබේ.

හිතවතුනට පමණක් සැලකීමේ දේශපාලනය නිමා කිරීම මගින් වෛරයේ හා පළිගැනීමේ දේශපාලන විෂම චක්‍රය අහෝසි කිරීම එමගින් කලහකාරී සමාජය කාරුණික සමාජයක් බවට පත් කිරීම, ආගමික නායකයින්ගේ අනුශාසනාවලට ගරු කිරීම, සිවිල් සමාජය බලගැන්වීම, රට වැසියනට හිරිහැර හා කරදර නොවන ඡන්ද ව්‍යාපාර පැවැත්වීම, කලහකාරීත්වය වෙනුවට සංවාදශීලීත්වය මැතිවරණ ක්‍රමයට සිදුකළයුතු අත්‍යවශ්‍ය සංශෝධන කිරීම ඡන්ද ව්‍යාපාරයට වියදම් කරන මුදල් සීමා කිරීම යන කරුණු මුදුන්පත් කරගැනීම මගින් මහජනතාවට ගරු කරන දේශපාලන සංස්කෘතියක් බිහිකිරීමට ජාතික සංගමය අරමුණු කරයි.

සියලු දෙනාගේ අදහස්වලට සවන්දෙන ක්‍රියාවලියකට මුල පිරීම පරිසර හිතකාමී පවිත්‍ර නගරයක් බිහි කිරීම, සිවිල් සමාජය, රජය හා පෞද්ගලික අංශය හා අන්තර්ජාතික ප්‍රජාව අතර සහයෝගය ශක්තිමත් කිරීම අපරාධ මත්ද්‍රව්‍ය පුරාව මැඩලීම, නාගරික දිළිඳු ජනතාව සඳහා ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආදී කරුණු රැසක් පුර නැඟුම සහ සහන සෙවන ව්‍යාපෘති යටතේ සිදු කැරෙයි.

තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වන නීති රීති කඩිනමින් සම්මතකොට ක්‍රියාවට නැංවීම දූෂණය මර්දනය කිරීම සඳහා පවතින අධිකරණ ක්‍රියාවලිය හා ආයතන ප්‍රතිසංස්කරණය කර ශක්තිමත් කිරීම මගින් දූෂණය මර්දනය කිරීමට අදහස් කර ඇත.

සුලුතර වරප්‍රසාද ආරක්ෂා කිරීම නොව රට වැසියා ආරක්ෂා කිරීම වෙනුවෙන් කැප වූ අධිකරණ ව්‍යුහයක් ස්ථාපිත කිරීම ළමා අපයෝජනය හා ලිංගික අඩන්තේට්ටම් මැඩලීමට ක්‍රියා කිරීම, නීතියට බියවීමට නොව නීතියට ගරු කිරීමට පොළඹවන සංස්කෘතියක් බිහි කිරීම ආදී කරුණු මුදුන්පත් කර ගැනීමෙන් නීතිය හා යුක්තිගරුක සමාජයක් බිහි කිරීමට අරමුණු කරගෙන තිබේ.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනසක් ඇති කිරීම සඳහා ප්‍රධාන ආගම් හා සබැඳි ලාභ නොලබන නව ප්‍රජා පාසල් පිහිටුවීම, පාසලක ප්‍රමුඛතාවන් තීරණය කිරීම හා අධීක්ෂණය සඳහා මව්පියන් හා ප්‍රජාව සවිබල ගැන්වීම ආදී කරුණු සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී ඇත.

ආර්ථික සංවර්ධනය මගින් සැමට සෞභාග්‍යය උදා කිරීම සඳහා රැකියා වියුක්තිය පහත හෙළා ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහල දැමීමට අවශ්‍ය වන්නා වූ සියයට අට සිට දහය දක්වා වාර්ෂික ආර්ථික වර්ධන වේගයක් කරා ළඟාවීම, ආර්ථිකය ජාත්‍යන්තරව වඩාත් තරගකාරී තත්ත්වයට පත් කිරීම, ලෝකයට විවෘත වෙමින් අපේ අනන්‍යතාව ද ආරක්ෂා කරගැනීමට හැකි පරිදි ජනතාවගේ ආත්ම විශ්වාසය ශක්තිමත් කිරීම, ඉන්දියාව තර්ජනයක් නොව හිතකර සාධකයක් වශයෙන් සැලකීම, ඉන්දියාවේ වේගවත් ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාවටද ලබාගැනීම උදෙසා ඉන්දියාව සමඟ පුළුල් ආර්ථික සහයෝගිතා ගිවිසුමකට එළැඹීම, රාජ්‍ය හා පෞද්ගලික අංශය අතර අන්‍යොන්‍ය යහපතට හේතුවන ශක්තිමත් සම්බන්ධතාවක් ස්ථාපිත වීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම, ප්‍රගතියට හා ආර්ථික සංවර්ධනයට බාධාකාරී වී ඇති යල්පැනගිය නීති රීති, රෙගුලාසි හා නිලධාරීවාදී සීමාවන් සංශෝධනය කිරීම, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත හා අනෙකුත් ව්‍යවසාය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම, නව තාක්ෂණික කර්මාන්ත, කෘෂි අංශයේ එකතු කළ අගය වැඩි කිරීම හා සාගර සම්පත් ආශ්‍රිත ව්‍යාපාර මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ විවිධාංගීකරණයක් ඇති කිරීම, ජාත්‍යන්තර ආර්ථික මධ්‍යස්ථානයක් හා කලාපය සඳහා පිවිසුම් දොරටුවක් බවට ශ්‍රී ලංකාව පත්කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම යන කරුණුවලට මුල්තැනක් ලබාදී ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා තුරන් කිරීම යන්න සාක්ෂාත් කරගැනීම සඳහා ජාතික හා කලාපීය නියෝජිත මණ්ඩලයන්ගේ සංයුතියෙන් සියයට 25ක් කාන්තා නියෝජිතවරියන් බවට අනිවාර්යෙන්ම පත්කිරීම හා එම ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා කාල වකවානු නියම කිරීම කාන්තාවගේ ප්‍රශ්න වෙනුවෙන් ඔම්බුඩ්ස්වුමන් තනතුරක් ඇති කිරීමට අදහස් කර තිබේ.

සියලු විදේශගත ශ්‍රී ලාංකිකයන්ට මෙරට මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව ලබාදීමට ද ජාතික සංගමය අදහස් කරයි.

ශ්‍රී ලංකාව අප සැමගේ උරුමයකි. අපේ ශක්තිය විවිධත්වයයි. යන කරුණු මූලික කර ගනිමින් ගැටුම් අවසන්ව ඇති බැවින් නැවත වරක් හොඳහිත හා විශ්වාසය ගොඩනැංවීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීම.

ප්‍රජාව හා පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනාගත හැකි ඵලදායී හා කාර්යක්ෂම ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම,

එකිනෙකාගේ අනන්‍යතාවන් සඳහා ගරු කරමින් සාමයෙන් හා ගෞරවනීය ලෙස සියලු ආගමික හා වාර්ගික කණ්ඩායම්වලට ජීවත්විය හැකි පරිසරයක් ගොඩනැංවීම, දෙමළ කතා කරන ජනතාවට ස්වකීය භාෂාවෙන් එදිනෙදා කටයුතු සිදුකර ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම, ස්වකීය ආගමික හා අධ්‍යාපනික කටයුතුවල නිරත වීමට දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන්ට පවත්නා සියලු බාධක හඳුනාගෙන ඒවා ඉවත් කිරීම.

වාර්ගික, ආගමික වැනි සාධක මත අසාධාරණ තත්ත්වයන්ට පිළියම් යෙදීම උදෙසා විශේෂ ඔම්බුඩ්ස්මන්වරයෙකු පත්කිරීම යන කරුණු පිළිබඳව සලකා බැලීමට අදහස් කරයි.

බලය බෙදීම මගින් සවිබල ගැන්වීම යටතේ විශේෂයෙන්ම උතුර හා නැගෙනහිර ජනතාව ඇතුළු සියලු කොටස්වල අභිලාෂයන් සපුරා ගැනීමට හැකි හා ගැටලුවලට විසඳුම් ලැබෙන විශ්වාසනීය බලය බෙදීමේ රාමුවක් නිර්මාණය කිරීම.

ස්වකීය ප්‍රාදේශීය ජනතාවගේ ගැටලු සඳහා විසඳුම් ලබාදීමට හැකි පරිදි පළාත් පාලන ආයතනවලට ප්‍රමාණවත් සම්පත් ලබාදීම ඒවා සවිබල ගැන්වීම සහ පුරවැසි කමිටු බලගැන්වීමටද අදහස් කරයි.

අපේ සමාජයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට හිමිවිය යුතු සම්භාවනීය තත්ත්වය ආරක්ෂා කිරීම හා ඔවුන් සවිබල ගැන්වීම උදෙසා දිප ව්‍යාප්ත ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන ජාලයක් ස්ථාපිත කිරීමටද ජාතික සංගමය අදහස් කරයි.

ගරුතර මහනායක ස්වාමීන්වහන්සේලා සමග සාකච්ඡා කර භික්ෂු ශාසනයේ ශික්ෂණය, විනය විරෝධී සහ ඇවැත් ක්‍රියාවන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි නීතිමය රාමුව, විනය නීති සම්බන්ධ මතභේද විසඳීමේ ක්‍රියාපටිපාටි සහ සාංඝික දේපළ භාරකාරත්වය සම්බන්ධ විධිවිධාන සැකසීම.

සහන සෙවණ හා විශ්වඥාන වැඩසටහනේ ව්‍යාප්තියක් වශයෙන් විහාරස්ථාන ආශ්‍රිතව ග්‍රාමසේවා නිලධාරී කාර්යාල සහ තොරතුරු තාක්ෂණ කේන්ද්‍ර පිහිටුවමින් ප්‍රජාව හා විහාරස්ථාන අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීමට පියවර ගැනීම.

ශ්‍රී ලංකාව බෞද්ධ දර්ශනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් වශයෙන් දියුණු කිරීම සහ ලොව පුරා ධර්ම ප්‍රචාරය සඳහා ධර්ම දූත වැඩසටහන් ප්‍රචලිත කිරීම යන කරුණු පිළිබඳවද ජාතික සංගමය අවධානය යොමු කොට ඇත.

**ශ්‍රී ලංකා ජාතික සංගමය**

161, කිඹිරිගස්යාය පාර, කොළඹ 5 යන ලිපිනයෙන් හෝ අඅඅගපසකසබ්ගදරට වෙබ් email@milinda.org අඩවියෙන්ද විද්‍යුත් තැපැල ඔස්සේද වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.